**බුලත්කොහුපිටිය ප්‍රාදේශීය සභාව.**

**කෑගල්ල දිස්ත්‍රික්කය**

1. <u>මූල්‍ය ප්‍රකාශන</u>

1.1 <u>මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම</u>

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2014 මාර්තු 31 දිනද ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2013 මාර්තු 21 දිනද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2014 සැප්තැම්බර් 11 දින සභාවේ සභාපතිවරයාට යවා ඇත.

1.2 <u>මතය</u>

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2013 දෙසැම්බර් 31 දිනට බුලත්කොහුපිටිය ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 <u>මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම</u>

1.3.1 <u>ගිණුම්කරණ අඩුපාඩු</u>

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) ඉකුත් වර්ෂය වෙනුවෙන් ලැබී තිබූ එකතුව රු. 1,898,508 ක් වූ මුද්දර ගාස්තු සමාලෝචිත වර්ෂයේ ආදායමක් ලෙස ගිණුම්ගත කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ ජූනි සිට දෙසැම්බර් දක්වා ලැබිය යුතු මුද්දර ගාස්තු ආදායම හඳුනාගෙන ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි. තවද,ගෙවිය යුතු මුද්දර ගාස්තු කාර්ය මණ්ඩල දීමනා වෙනුවෙන් වෙන් කිරීමද කර නොතිබුණි.

(ආ) ඉකුත් වර්ෂය සඳහා ලැබී තිබූ එකතුව රු. 2,737,102 ක්වූ හිඟ උසාවි දඩ ආදායම් සමාලෝචිත වර්ෂයේ ආදායම් ලෙස ගිණුම්ගත කර තිබූ අතර, සමාලෝචිත වර්ෂයට අදාල ආදායම ගණනය කර ගිණුම්ගත කර නොතිබුණි. තවද, උසාවි දඩ කාර්ය මණ්ඩල දීමනා ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) වරිපනම් බදු හා අක්කර බදු කලින් ලැබීම් පිළිවෙලින් රු. 29,495 ක් හා රු.3,049 ක් වශයෙන් එකතුව වූ රු. 32,544 ක් සමාලෝචිත වර්ෂයේ ආදායම් ලෙස ගිණුම්ගත කිරීම හේතුවෙන් ණයහිමියෝ අඩුවෙන් දක්වා තිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂයේ පරිත්‍යාග වශයෙන් ලැබී තිබූ එකතුව රු. 38,431 ක් වූ පුස්තකාල පොත් ප්‍රාග්ධන යෙදුමට ආදායමින් දායක වීමේ ගිණුම බැර කිරීම මගින් ප්‍රාග්ධනිත කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂය අවසානයේ දී ලැබිය යුතු පුනරාවර්තන ආදායම් එකතුව රු. 1,131,293ක් ආදායම් ණයගැතියන් යටතේ ගිණුම්ගත කර නොතිබුණි.

(ඊ) සමාලෝචිත වර්ෂයේ සැපයුම් හා උපකරණ වියදම වූ රු. 2,512,415 ක අගය ගණනය කිරීමේදී වර්ෂයේ මිලදී ගැනීම් රු. 1,616,486 කට වර්ෂයේ නිකුත් කිරීම් රු. 317,246 ක් එකතු කර දැක්වීම හේතුවෙන් සැපයුම් හා උපකරණ වියදම රු. 634,432 ක් වැඩියෙන් දක්වා තිබුණි.

(උ) 2013 ප්‍රාදේශීය සංවර්ධන සැලැස්ම යටතේ පළාත් සභා ප්‍රතිපාදන ලැබීම් හා ගෙවීම් පොදු තැන්පත් ගිණුම මඟින් සිදු කිරීම හේතුවෙන් ප්‍රතිපාදන ලැබීම් එකතුව රු. 2,907,800 ක් හා කර්මාන්ත සඳහා ගෙවීම් එකතුව රු. 1,863,675 ක් ප්‍රාග්ධන ලැබීම් හා වියදම් යටතේ ගිණුම්ගත කර නොතිබුණි.

(ඌ) පොදු ගබඩාව සඳහා මිලදීගත් රු. 108,118 ක් වූ ගබඩා ද්‍රව්‍ය සමාලෝචිත වර්ෂය තුළදී අනුචිතව ප්‍රාග්ධන යෙදුමට ආදායමින් දායකවීමේ ගිණුම බැර කරමින් ප්‍රාග්ධනිත කර තිබුණි.

(එ) සමාලෝචිත වර්ෂය තුල මිලදී ගත් ලිපිද්‍රව්‍ය වටිනාකම වූ රු. 177,969 ක් අනුචිතව ප්‍රාග්ධන යෙදුමට ආදායමින් දායකවීමේ ගිණුමට බැර කරමින් ප්‍රාග්ධනිත කර තිබුණි.

(ඒ) සමාලෝචිත වර්ෂයේ පරිත්‍යාග වශයෙන් ලැබූ රු. 149,608 ක් වූ ලී බඩු හා උපකරණ ප්‍රාග්ධන යෙදුමට ආදායමින් දායකවීමේ ගිණුම බැර කිරීම මඟින් ප්‍රාග්ධනිත කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඔ) 2013 වර්ෂයට අදාල භාණ්ඩ සමීක්ෂණ වාර්තාවට අනුව, මහජන පුස්තකාලයට අදාල ඉන්වෙන්ට්‍රි භාණ්ඩ යටතේ දක්වා ඇති රු. 161,520 ක්, ස්ථාවර වත්කම් යටතේ ශේෂ පත්‍රයේ ගිණුම්ගත කර නොමැති නිසා එම ප්‍රමාණයෙන් ස්ථාවර වත්කම් අඩුවෙන් දක්වා තිබුණි.

(ඕ) ස්ථාවර වත්කම් ගිණුමේ එකතුව, ප්‍රාග්ධන යෙදුමට ආදායමින් දායකවීමේ ගිණුමෙහි ශේෂයට සමාන විය යුතු වුවද, සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට නිරීක්ෂණය වූ රු. 9,517,856 ක්වූ වෙනස හඳුනාගෙන නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ක) ඉකුත් වර්ෂය අවසානයට ණයහිමි ගිණුම හා ණයහිමි ලේඛනය අතර පැවති රු. 1,206,237 ක් වූ වෙනස් වීමක් සැසඳීමකින් තොරව සමාලෝචිත වර්ෂය තුලදී සමුච්චිත අරමුදලට ලියා හැරීමට කටයුතු කර තිබුණි.

(ග) ඉන්වෙන්ට්‍රි භාණ්ඩ වල වටිනාකම හා ලී බඩු හා සවිකිරීම් ගිණුමේ ශේෂ සැසඳීමේදී දක්නට ලැබුණු රු. 212,288 ක් වූ වෙනස අනුචිතව සමුච්චිත අරමුදල් හා ඌනතා ගිණුම මඟින් ගලපා තිබුණි.

1.3.2 <u>ගෙවිය යුතු ගිණුම්</u>

2013 දෙසැම්බර් 31 දිනට අවුරුදු 01 ක කාලයක් ඉක්මවා තිබූ ගෙවිය යුතු ගිණුම් ශේෂ වල වටිනාකම රු. 9,066,418 ක් විය.

1.3.3 නීති, රීති හා රෙගුලාසි ආදියට අනුකූල නොවීම.

පහත දැක්වෙන නීති, රීති, රෙගුලාසි විධිවිධාන වලට හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම් විගණනයේදී නිරීක්ෂණය විය.

| | නීති, රීති, රෙගුලාසි විධිවිධාන වලට හා කළමනාකරණ තීරණ වලට යොමුව | අනුකූල නොවීම් |
|---|---|---|
| (අ) | 2005 ජූනි 01 දින අංක 2005/04 දරන සබරගමුව පළාත් පාලන කොමසාරිස්ගේ චක්‍රලේඛය 03(ii) හා (iii) ඡේදය | ඉඩම් කට්ටිකර විකිණීමට අදාල කට්ටි සැලැස්ම අනුමත කිරීමට පෙර සභාවේ ආදායම් පරීක්ෂක /පරිපාලක මඟින් තාවකාලික තක්සේරුවක් ලබාගෙන එකී තක්සේරුව පදනම් කරගෙන 1% ක අත්තිකාරම් මුදලක් විකුණුම්කරුගෙන් ලබාගැනීමට කටයුතු කර නොතිබුණි. |
| (ආ) | 2012/05/29 දින අංක 03/2012 දරණ පළාත් පාලන කොමසාරිස්ගේ චක්‍රලේඛය | ඉන්ධන දීමනා ලබාගැනීම සඳහා ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරුන් සතුව යතුරුපැදියක්, මෝටර් රථයක්, ත්‍රීරෝද රථයක් හෝ වෑන් රථයක් පැවතිය යුතු බව දක්වා ඇතත් එවැනි වාහනයක් නොමැතිව මන්ත්‍රීවරුන් දෙදෙනෙකුට ඉන්ධන දීමනා ලෙස රු. 128,000 ක් ගෙවා තිබුණි. |

02. මූල්‍ය සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 1,352,552 ක් වූ අතර, ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ ආදායම ඉක්මවූ පුනරාවර්තන වියදම රු. 2,791,924ක් වූයෙන් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයේ රු. 4,144,476 ක වර්ධනයක් පෙන්නුම් කෙරේ.

2.2 ආදායම් පරිපාලනය

2.2.1 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

සභාපතිවරයා විසින් සමාලෝචිත වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

ආදායම් ප්‍රභවය

| | ඇස්තමේන්තුගත | තථ්‍ය | දෙසැම්බර් 31දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|
| | රු. 000 | රු. 000 | රු. 000 |
| (i) වරිපනම් හා බදු | 1,211 | 1,087 | 124 |
| (ii) බදු කුලී | 1,978 | 1,756 | 222 |
| (iii) බලපත්‍ර ගාස්තු | 235 | 210 | 25 |
| (iv) වෙනත් ආදායම් | 8,460 | 18,379 | (9,919) |

2.2.2 උසාවි දඩ

මහේස්ත්‍රාත් අධිකරණ 02 කින් ලැබිය යුතු උසාවි දඩ මුදල් ගණනය කර ගිණුම්ගත කර නොතිබුණි.

2.2.3 කඩකාමර බදු

සභාව මගින් අළුතින් ඉදිකරන ලද පොදු වෙළඳ සංකීර්ණයේ කඩ කාමර 10 ක් 2011 වර්ෂයේ සිට බදු දී තිබූ අතර, එම කඩ කාමර සඳහා එක්වන් මුදල් වශයෙන් රු. 10,190,000 ක් ලබාගෙන තිබුණි. තක්සේරු වාර්තාව අනුව උඩුමහලේ කඩකාමරයක් රු. 5,000 බැගින්ද, පහත මාලයේ කඩකාමරයක් රු. 7,500 බැගින්ද තක්සේරු කර තිබූ අතර මෙම තක්සේරුව වර්ෂ තුනක කාලයක් සඳහා බලපැවැත්වෙන බව සඳහන් කර තිබුණි. 2010 නොවැම්බර් මස 24 වන දින පැවැත්වූ මහා සභාවේදී එක් කඩ කාමරයක් රු. 1,250 බැගින් අයකිරීමට ඒකමතිකව තීරණය කර එපරිදි මුදල් අයකර නොතිබුණි.

03. මෙහෙයුම් සමාලෝචනය

3.1 මෙහෙයුම් අකාර්යක්ෂමතා

(අ) රු. 53,300 ක් වූ සේවක ඇප තැන්පතු මුදල් එක් එක් නිලධාරීන්ගේ පාස් පොත්වල තැන්පත් කිරීම වෙනුවට පොදු තැන්පත් ගිණුමේ රඳවාගෙන තිබුණි.

(ආ) ස්ථාන මාරුවී ගිය නිලධාරීන් 04 දෙනෙකුගෙන් අයනොවී පැවති එකතුව රු. 56,300 ක් වූ සේවක ණය ශේෂයක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

04. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

4.1 අභ්‍යන්තර විගණනය

1988 මූල්‍ය හා පරිපාලන රීති මාලාවේ 5(7) ප්‍රකාරව මූල්‍ය හා ගබඩා සම්බන්ධයෙන් ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් පවත්වා ගෙන යාම සභාපතිවරයාගේ කාර්යභාරයක් වුවද, ඒ අනුව කටයුතු කර නොතිබුණි.

05. පද්ධති හා පාලන

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය

(ආ) ආදායම් පරිපාලනය

(ඇ) වත්කම් කළමනාකරණය